ගෝමරන්කඩවල ප්‍රාදේශීය සභාව
-------------------------------------
ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය
--------------------------

1. මූල්‍ය ප්‍රකාශන
------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
--------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 අගෝස්තු 21 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ඔක්තෝබර් 02 වැනි දින සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට ගෝමරන්කඩවල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
------------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
-------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ ඉදිකළ ගොඩනැගිලිවල වටිනාකම රු.1,545,012 ක් වුවත් එය රු.1,665,553 ක් ලෙස ගිණුම්ගත කර තිබුණු බැවින් ස්ථාවර වත්කම් හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුමේ වටිනාකම රු.120,541 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දී පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් සභාවට පරිත්‍යාග කර තිබුණු ට්‍රැක්ටර් රථයේ වටිනාකම රු 1,209,000 ක් වුවත් එය රු.1,800,000 ක් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් ස්ථාවර වත්කම් හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුම රු.591,000 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) එකතුව රු.1,146,275 ක් වූ ඉන්වෙන්ට්‍රි විෂයයන් හා කසල බඳුන් ජංගම නොවන වත්කම් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් ජංගම නොවන වත්කම් හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීම් ගිණුම එම වටිනාකමෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයට අදාළ උපාචිත දඩ ආදායම් රු.2,254,750 ක් ගිණුම්ගත කර නොතිබීම හේතුවෙන් ආදායම් එම වටිනාකමෙන් අඩුවෙන් දැක්වුණු අතර 2016 වර්ෂයට අදාළව උපාචිතදඩ ආදායම් රු.1,219,077 ක් සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස දක්වා තිබුණි.

(ඉ) සභාව විසින් මිලදී ගෙන තිබූ රු. 31,600 ක් වටිනා තණකොළ කපන යන්ත්‍ර 2 ක සහ ග්‍රයින්ඩර් යන්ත්‍රය ප්‍රාග්ධන ගතකර නොතිබුණි.

(ඊ) සභාවේ සතිපොල හා ආපනශාලාවේ ඉදිකිරීම් පිරිවැය රු. 2,525,751 ක් වුවද, එය රු. 2,500,000 ක් ලෙස ප්‍රාග්ධන ගතකර තිබීම හේතුවෙන් ජංගම නොවන වත්කම් රු. 25,751 කින් අඩුවෙන් දක්වා තිබුණි.

1.3.2 තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම

---

තැන්පතු සහතික ඉදිරිපත් නොකිරීම නිසා රු.130,621 ක් වූ සභාවේ තැන්පතු විගණනයේ දී සතුටුදායක ලෙස සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.3 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්.

---

විගණනයේදී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 217 | නියමිත ආකෘතියෙහි දැක්වෙන පරිදි ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 | වර්ෂ 04 කට වැඩි රු. 7,500 ක විවිධ තැන්පතු නිරවුල් කිරීමට හෝ ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

---

2.1 මූල්‍ය ප්‍රතිඵලය

---

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 1,729,746 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 3,189,451 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

---

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

---

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| (i) කුලී | 1,860 | 1,964 | 1,858 | 106 | 1,321 | 1,812 | 1,694 | 117 |
| (ii) බලපත්‍ර ගාස්තු | 119 | 130 | 130 | - | 98 | 120 | 120 | - |
| (iii) වෙනත් ආදායම් | 1,158 | 1,754 | 1,754 | - | 911 | 3,062 | 3,062 | - |

2.2.2 කුලී

------

සභාව විසින් කුලියට ලබා දී තිබුණු කඩකාමර හා කුලී නිවාසවල මාසික කුලී ආදායම රු.1,444 ත් රු.2,477ත් අතර විය. ඒ අනුව එම කඩකාමර සහ කුලී නිවාස නැවත තක්සේරු කර වර්තමානයට ගැළපෙන මාසික කුලියක් අයකිරීම කෙරෙහි සභාවේ අවධානය යොමු කර නොතිබුණි.

2.2.3 මුද්දර ගාස්තු

--------------

2016 හා 2017 වර්ෂ සඳහා පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් ලැබිය යුතු මුද්දර ගාස්තුව පිළිබඳව විමසා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

3.1 කාර්යය සාධනය

--------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

-------------------

ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 28 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2017 දෙසැම්බර් 31 දින වන විටත් සභාව විසින් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි.

(ආ) ක්‍රියාකාරී සැලැස්ම

----------------------

2014 පෙබරවාරි 17 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2014 අනුව 2017 වර්ෂය වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ඇ) අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම

------------------------------------------

මහජන සේවා පුළුල් කිරීම හා සභාවේ ආදායම් වර්ධනය කර ගැනීමේ අරමුණින් ප්‍රාදේශිය සභා ශක්තිමත් කිරීමේ ජාතික වැඩසටහන 2017 යටතේ සභාවේ පැරණි කාර්යාල ගොඩනැගිල්ල රු.2,765,320 ක් වැයකර 2017 දෙසැම්බර් 28 දින වන විට අළුත්වැඩියා කටයුතු නිම කර තිබුණද

එමගින් අපේක්ෂිත අරමුණු ඉටු කිරීමට 2018 සැප්තැම්බර් 07 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

(ඈ) පරිසර බලපත්‍ර නිකුත් කිරීම

1988 අංක 56 සහ 2000 අංක 53 දරන පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23 "අ" වගන්තියේ විධිවිධාන ප්‍රකාරව පාරිසරික හානි සිදු වන වී මෝල්, වඩු කර්මාන්ත සහ සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන ආයතන ආදී ව්‍යවසායන් ක්‍රියාත්මක කිරීමේ දී පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගත යුතු වුවත් සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක වන එවැනි ව්‍යවසායන් 21 ක් බලපත්‍ර ලබා ගැනීමකින් තොරව පවත්වා ගෙන යමින් තිබුණි. මේ සම්බන්ධයෙන් ඇති විය හැකි පාරිසරික ගැටළු නිරාකරණය කිරීමට සභාව විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඉ) තිරසර සංවර්ධන ඉලක්ක

සභාව විසින් තිරසර සංවර්ධන ඉලක්ක ලෙස පිරිසිදු පානීය ජලය සහ ප්‍රදේශයේ ජනතාවට ලබාදීම සහ පරිසරය සුරැකීම කෙරෙහි අවධානය යොමු කර අදාළ ඉලක්කයන් හා අදාළ කාර්යයන් ඉටු කිරීමට අවශ්‍ය වැඩපිළිවෙලක් මෙන්ම ඒවා සඳහා නිර්ණායකයන් හඳුනාගෙන නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාවට අයත් මීගහවත්ත පොදු ළිඳ පිහිටි ඉඩමෙහි සභාවේ අනුමැතියකින් තොරව සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් කඩකාමරයක් ඉදිකර පානීය ජලය අලෙවි කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යන නමුත් ඒ සම්බන්ධයෙන් සභාව විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) 2014 අයවැය යෝජනා අනුව සංවර්ධන කටයුතු අධීක්ෂණය කිරීම සඳහා පළාත් පාලන මහජන නියෝජිතයින් සඳහා සහනදායී පදනමට යතුරුපැදි ලබා දීමේ වැඩසටහන යටතේ සභිකයන් 08 දෙනෙකුගෙන් යතුරුපැදි ලබා දීමට අදාළව අයකරගෙන තිබුණු රු.362,870 ක් ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත යැවීමට කටයුතු නොකර 2018 සැප්තැම්බර් 07 දින වනවිටත් පොදු තැන්පත් ගිණුමේ රඳවා තිබුණි.

(ඇ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 29 ප්‍රකාරව දෛනිකව එකතු වන සම්පූර්ණ මුදල දිනපතාම බැංකුවේ තැන්පත් නොකර ප්‍රමාද වී තැන්පත් කර තිබුණි. එමෙන්ම මුදල් තැන්පත් කිරීමේ දී එකතු කරන ලද සියලුම මුදල් බැංකුගත කිරීමට කටයුතු නොකර තැන්පත් කරනු ලබන සෑම දිනකම රු.6,000 ත් රු.20,000 ත් අතර ප්‍රමාණයක් අත රඳවාගෙන තිබුණි.

(ඈ) සභාව විසින් කුලියට දෙනු ලබන වාහන සඳහා කුලී ආදායම් ලේඛන පවත්වා ගෙන ගොස් නොතිබුණි.

3.3 මානව සම්පත් කළමනාකරණය

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාවේ සේවය කළ තාක්ෂණික නිලධාරියා 2018 මැයි 28 දින සිට කුච්චවේලි ප්‍රාදේශිය සභාව වෙත ස්ථාන මාරු කිරීමේදී ඒ වෙනුවට අනුප්‍රාප්තික නිලධාරියා 2018 සැප්තැම්බර් 07 දින වන විටත් සේවයට වාර්තා කර නොතිබීම හේතුවෙන් 2018 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට යෝජිත සංවර්ධන කටයුතු අධීක්ෂණය කිරීමට නොහැකි වී තිබුණි.

(ආ) 2008 දෙසැම්බර් 31 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 30/2008 අනුව ආපදා ණය ලබා දිය හැකි උපරිම මුදල රු.250,000 ක් වුවත් එම මුදල ඉක්මවා නිලධාරියෙකු වෙත රු.264,270 ක ණය ලබා දී තිබුණි.

(ඇ) 2015 ජූලි 23 දිනැති අංක 07/2015 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛයේ 07 ඡේදය ප්‍රකාරව සේවකයින්ගේ මුළු මාසික ඉපැයීම්වලින් සියයට 20 ක දායක මුදල් අයකර ගත යුතු වුවද ආදේශක පදනම මත සහ ස්ථිර පදනම මත බඳවාගත් සේවකයන් තිදෙනෙකුගෙන් 2016 හා 2017 වර්ෂයේ දායක මුදල මූලික වැටුප මත ගණනය කර තිබුණි. මේ හේතුවෙන් සේව්‍යාගේ හා සේවකයාගේ දායක මුදල රු.135,240 ක් අඩුවෙන් ගණනය කර තිබුණි.

(ඈ) (i)කළමනාකරණ සහකාර අධිශ්‍රේණියේ තනතුරක් වන සභාවේ ලේකම් තනතුරට වැඩ බලන පදනම මත කළමනාකාර සහකාරවරයෙකු පත්කර තිබුණු අතර, 2018 සැප්තැම්බර් වන විටත් පුරප්පාඩුව පිරවීමට කටයුතු කර නොතිබුණි.

(ii)සංවර්ධන නිලධාරි, කළමනාකරණ සහකාර සහ ආදායම් පරීක්ෂක තනතුරුවල පවතින පුරප්පාඩු හේතුවෙන් සභාවේ කටයුතු නිසි පරිදි සිදු කර ගෙන යාමේ දුෂ්කරතාවයන් පැවතුණි.

3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

----------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිත ආයතනය මගින් ක්‍රියාත්මක කරනු ලබන " ඉ නැණසල " ව්‍යාපෘතිය සභාවේ මහජන පුස්තකාලයේ 2014 නොවැම්බර් 18 දින ආරම්භ කර පරිගණක , මුද්‍රණ යන්ත්‍ර , ස්කෑනර්, වෙබ් කැමරා යනාදි උපකරණ ලබා දී තිබුණ ද එමගින් අපේක්ෂිත ප්‍රතිලාභ ජනතාවට ලබා දීමට 2018 සැප්තැම්බර් වන විටත් කටයුතු කර නොතිබුණි.

(ආ) පළාත් පාලන ආයතනවල පෙරටු කාර්යාල ස්ථාපනය කිරීමේ වැඩසටහන 2017 අනුව පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ සභාව විසින් රු.283,998 ක් වටිනා කාර්යාල උපකරණ මිලදී ගෙන තිබුණි. එම වැඩසටහන සඳහා 2018 වර්ෂයේ දී පරිගණක හා උපාංග කට්ටල 03 ක් හා මුද්‍රණ යන්ත්‍රයක්ද අමාත්‍යාංශය විසින් සභාවට ලබා දී තිබුණද 2018 සැප්තැම්බර් වන විටත් එවැනි පෙරටු කාර්යාලයක් ස්ථාපනය කර නොතිබුණි.

3.5 වත්කම් කළමනාකරණය

------------------------------

3.5.1 නිෂ්ක්‍රිය හා ඌණ උපයෝජිත වත්කම්

-----------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාවට අයත් මැදවච්චිය කාර්යාලය 2016 ඔක්තෝබර් සිට නිෂ්කාර්යව පැවති අතර, එම ගොඩනැගිල්ල ප්‍රයෝජනවත් කාර්යයක් සඳහා යෙදවීමට සභාවේ අවධානය යොමුවී නොතිබුණි.

(ආ) 2016 වර්ෂයේ දී ඉවත්කරන ලද පැරණි ජල බවුසර් ටැංකිය භාවිතා කළහැකි තත්වයේ පැවතියද එය ඵලදායි කාර්යයන් සඳහා යොදා නොගෙන 2018 සැප්තැම්බර් 07 දින වන විටත් නිෂ්කාර්යව පැවතුණි.

(ඇ) සභාව සතු මිට්ෂුබිෂි කැබ් රථය 2004 වර්ෂයේ සිට ද, ට්‍රැක්ටරය 2008 වර්ෂයේ සිටද, භාවිතයට නොගෙන ඉවත් කර තිබූ අතර, ඒවා අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ අපහරණය කිරීමට 2018 සැප්තැම්බර් 07 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

3.5.2 භාණ්ඩ සමීක්ෂණය

----------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2017 වර්ෂයට අදාළව 2018 ජූනි 22 දින පැවැත්වූ භාණ්ඩ සමීක්ෂණය අනුව හඳුනා ගන්නා ලද අළුත්වැඩියා කළ යුතු, විකිණිය යුතු හා විනාශ කළ යුතු භාණ්ඩ සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද නිර්දේශයන් 2018 සැප්තැම්බර් 07 දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව සමීක්ෂණයට ඉදිරිපත් නොකළ පොත් 25 ක් සම්බන්ධයෙන් 2018 සැප්තැම්බර් 07 දින වනවිටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

3.6 හඳුනාගත් අලාභ

-------------------

මැදවච්චිය කඩකාමර අංක 06 හි විදුලි බිල්පත් යාවත්කාලීනව නොගෙවීම හේතුවෙන් විදුලිය විසන්ධි කර තිබූ අතර නැවත විදුලි සම්බන්ධතාවය ලබා ගැනීම වෙනුවෙන් රු.12, 354 ක් ගෙවා තිබුණි.

3.7 ප්‍රසම්පාදනය

---------------

3.7.1 ප්‍රසම්පාදන සැලැස්ම

------------------------

2014 පෙබරවාරි 17 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2014 අනුව 2017 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.

3.7.2 කොන්ත්‍රාත් පරිපාලනය

--------------------------

3.7.2.1 ගෝමරන්කඩවල පානීය ජල ව්‍යාපෘතිය

------------------------------------------

සභා බල ප්‍රදේශය තුල බීමට සුදුසු පානීය ජලය නොමැති වීමේ ගැටළුවට විසඳුමක් වශයෙන් පුර නැගුම ව්‍යාපෘතිය යටතේ පානීය ජල ව්‍යාපෘතියක් අදියර තුනක් යටතේ ක්‍රියාත්මක කිරීම සඳහා සභාව විසින් රු. 51,571,930 ක් වටිනා ගිවිසුම් 03ක් අත්සන් කර තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) මෙම ව්‍යාපෘතියෙහි අරමුණ වූයේ ගෝමරන්කඩවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් ගෝමරන්කඩවල හා කන්දමාලාව ග්‍රාමසේවා වසම් දෙකෙහි පදිංචි පවුල් 685 කට සෞඛ්‍යාරක්ෂිත පානීය ජලය ලබාදීම වුවත් ඉදිකරන ලද ළිඳෙහි ජලය දුඹුරු පැහැ ගැන්වී තිබීමත් හා පිරිපහදු කිරීමේ ක්‍රමවේදයක් ව්‍යාපෘතියට ඇතුළත් කර නොතිබීම නිසා එහි ජලය බීමට නුසුදුසු තත්වයේ පැවතිණි.

(ආ) මෙම ව්‍යාපෘතියේ අධීක්ෂණ හා උපදේශණ කටයුතු සිදු කිරීම වෙනුවෙන් ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය සමඟ 2013 මැයි 13 දින ගිවිසුම් අත්සන් කර ඒ වෙනුවෙන් රු. 2,623,200 ක් ගෙවා තිබුණි. නමුත් නිසි පරිදි ශක්‍යතා අධ්‍යයනයක් සිදු නොකර ළිඳ ඉදිකිරීම හා ළිඳ පිහිටි ස්ථානයේ සිට කිලෝමීටර 1 1/2 ක් පමණ දුරින් පිහිටි ස්ථානයක ටැංකිය ඉදිකිරීම නිසා අපේක්ෂිත පවුල් වෙත නිසි පරිදි ජලය ලබා දීමට නොහැකි වී තිබුණි.

(ඇ) මෙම ව්‍යාපෘතිය යටතේ මඩුගහවැව ගම්මානයේ ගෘහ ඒකක සඳහා ජලසැපයුම ලබා දී තිබුණද 2018 සැප්තැම්බර් 07 දින සිදු කරන ලද ක්ෂේත්‍ර පරීක්ෂණයේදී එම ගම්මානයේ ජනතාවට ජලය ලැබී නොතිබූ අතර විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කර ජලපහසුකම් ලබා දීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඈ) ළිඳෙහි ජලය ප්‍රමාණවත් නොවීම හා සෞඛ්‍යාරක්ෂිත නොවීම හේතුවෙන් ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලයේ උපදෙස් පරිදි මෙම ජල ව්‍යාපෘතියේ හතරවන පියවර ලෙස නල ළිඳක් ඉදිකිරීම හා ජල සැපයුම් ලබාදීම වෙනුවෙන් 2016 ජනවාරි 27 දින රු. 6,986,000 ක් වටිනා කොන්ත්‍රාත්තුවක් පිරිනමා තිබුණි. මේ යටතේ පවුල් 325 ක් වෙනුවෙන් ජල සැපයුම් උපාංග මිලදී ගත යුතු වුවද, උපාංග 475 ක් මිලදී ගැනීම හේතුවෙන් ගබඩාව තුල රු. 1,399,380 ක් වටිනා උපාංග 228 ක් නිෂ්කාර්යව පැවතුණි.

3.7.2.2 ගල්කඩවල අත්කම් කර්මාන්ත පාර කොන්ක්‍රීට් කිරීම
----------------------------------------------------------

ප්‍රාදේශිය සභා සංවර්ධන ප්‍රදාන වැඩසටහන යටතේ ගල්කඩවල අත්කම් කර්මාන්ත පාර කොන්ක්‍රීට් කිරීම වෙනුවෙන් 2016 ජූලි 30 දින රු. 2,148,615 ක් වටිනා කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කර මාර්ගයෙහි වැඩ 2016 සැප්තැම්බර් 07 දින නිම කර තිබූ නමුත් මාර්ගයේ ස්ථාන කිහිපයක් පුපුරා ගොස් තිබුණි. පිපිරු ස්ථාන කොන්ත්‍රාත්කරු ලවා සකස්කර ගැනීමට කටයුතු නොකර ඊට අදාළ රඳවුම් මුදල වූ රු.211,365 ක් 2017 මාර්තු 14 දින නිදහස් කර තිබුණි. එමෙන්ම මෙම මාර්ගය ආරම්භ වන ස්ථානය වැසි දිනයන්හිදී ජලයෙන් යටවන නිසා එම ස්ථානයේ බෝක්කුවක් ඉදිනොකිරීම හේතුවෙන් මාර්ගයෙහි ගමනාගමනය අපහසු වී තිබුණි.

4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය
------------------------------------------

4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
-----------------------------------

1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති අංක 168 (i) අනුව මාර්තු 31 දිනට පෙර මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 අගෝස්තු 21 වැනි දින ඉදිරිපත් කර තිබුණි.

4.2 අයවැය පාලනය
--------------------

සමාලෝචිත වර්ෂයේ අයවැයගත ආදායම හා වියදම සහ තත්‍ය ආදායම හා වියදම අතර සියයට 13 සිට සියයට 92 දක්වා වූ පරාසයක විචලනයක් පැවතුණි. ඒ අනුව වාර්ෂික අයවැය විධිමත් මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

5. පද්ධති හා පාලන
---------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධතිය | අඩුපාඩුව |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | (i) වත්කම් ගිණුම්ගත නොකිරීම<br>(ii) ආදායම් ගිණුම්ගත නොකිරීම |
| (ආ) | ආදායම් පරිපාලනය | හිඟ ආදායම් අය නොකිරීම |
| (ඇ) | කොන්ත්‍රාත් පරිපාලනය | (i) කොන්ත්‍රාත් ඇගයීම් නොකිරීම<br>(ii) ප්‍රමාද වී නිමකිරීම |
| (ඈ) | මානව සම්පත් කළමනාකරණය | සේවක පුරප්පාඩු පිරවීමට කටයුතු නොකිරීම. |